# බළන්ගොඩ නගර සභාව
# බළන්ගොඩ තානායම සඳහා ලංසු ආරාධනයයි.

වර්ෂ 2017 මාර්තු මස 01 වන දින සිට 2022 පෙබරවාරි මස 28 වන දින දක්වා වසර 05 (පහ)ක කාලයකට බදු දීම සඳහා පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන බළන්ගොඩ නගරසභා තානායම වෙනුවෙන් මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත් බළන්ගොඩ නගර සභාවේ ලේකම් එස්.එච්.ඒ. කරුණාරත්න වන මා විසින් 2017 පෙබරවාරි මස 23 (විසිතුන්) වන දින පෙ.ව10.00 (දහය) දක්වා භාරගනු ලැබේ. වැඩි විස්තර කාර්යාලයීය දුරකථන අංක 045-22 87 275 කාර්යාල වේලාවේ දී ඇමතීමෙන් හෝ urbanbg@sltnet.lk වෙතින් ලබාගත හැකි ය.

**තානායම් පරිශ්‍රය පරීක්ෂා කිරීමට ඇති හැකියාවඃ**

ටෙන්ඩර් අයදුම් කිරීමට අපේක්ෂිතයෙක් හට 2017 පෙබරවාරි මස 13 (දහතුන) වන දින සිට 2017 පෙබරවාරි මස 21(විසිඑක) වන දින දක්වා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 09.00 (නවය) සිට ප.ව. 04.00 (හතර) දක්වා බළන්ගොඩ නගර සභා තානායම හා පරිශ්‍රය නගරසභාවේ ලේකම්ගේ අනුමැතිය සහිතව පරීක්ෂාකළ හැකි ය.

**ලංසුපත් නිකුත් කිරීමඃ**

2017 පෙබරවාරි මස 22 (විසිදෙක) වන දින ප.ව. 03.00 (තුන) දක්වා ලංසුපත් බළන්ගොඩ නගර සභා කාර්යාලයේ දී නිකුත් කරනු ලැබේ.

**ලංසුපත් භාර ගැනීමඃ**

2017 පෙබරවාරි මස 23 (විසිතුන) වන දින පෙ.ව. 10.00 (දහය) දක්වා ලංසුපත් භාරගනු ලැබේ. සම්පූර්ණ කරන ලද ඔබගේ ලංසු අයදුම්පත් "ලේකම්, බළන්ගොඩ නගර සභාව" යන ලිපිනයට ලේඛනගත තැපෑලෙන් යොමු කිරීමෙන් හෝ කාර්යාලයේ තැන්පත්කර ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනැවිත් බහාලීමෙන් හෝ ඉදිරිපත් කළ හැකි ය.

**ලංසුපත් විවෘත කිරීමඃ**

2017 පෙබරවාරි මස 23 (විසිතුන) වන දින පෙ.ව. 10.30 (දහයයි තිහ) ට ටෙන්ඩර් පෙට්ටිය බළන්ගොඩ නගරසභා කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ලංසුපත් විවෘතකිරීමේ අවස්ථාවට ලංසු අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ ලිඛිත ව බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකි ය.

**විශේෂ කොන්දේසිඃ**

ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ "බළන්ගොඩ නගර සභා තානායම සඳහා ටෙන්ඩර්ය" ලෙස සඳහන් කළ යුතු ය.

## උප ලේඛනය

| අනු අංකය | ලංසුපත් කැඳවනු ලබන ව්‍යාපාරයේ ස්වභාවය | බදු කාලය | ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල | ආපසු ගෙවනු නොලබන ලංසුඅයදුම්පත් ගාස්තු | | | අවම මාසික ලංසු මුදල |
|---|---|---|---|---|---|---|---|
| | | | | ගාස්තුව | වැට් | එකතුව | |
| 01 | බළන්ගොඩ නගරසභා තානායම | **අවුරුදු 05 කි** | රු.25,000/= | රු.5,000/= | රු.750/= | රු.5,750/= | රු. 250,000/= |

පිළිගත් අවම ලංසුවට අමතරව රජය විසින් කලින් කලට පනවන බදු මුදල් ද ගෙවිය යුතුය.

තෝරා ගන්නා ලද බදු කරුවන්ගෙන් ගිවිසුම් ඇප තැන්පත් මුදල් වශයෙන් මාස තුනක කුලී මුදලට සමාන මුදලක් සභාවට ගෙවිය යුතු අතර, එය වාරික දෙකක් වශයෙන් බළන්ගොඩ නගර සභාවට ගෙවිය හැකි ය. එම මුදලින් තුනෙන් එකක කොටසක් ලංසු අයදුම්කරු තෝරා ගෙන පළමු පැය තුළ තැන්පත් කළ යුතු ය. එසේ නොවුණහොත් ටෙන්ඩරය අවලංගුවන අතර ටෙන්ඩර් ඇප තැන්පත් මුදල ද සභා සතුවන්නේ ය. ඉතිරිය එකවර තැන්පත් කර 2017 පෙබරවාරි මස 28 (විසිඅට) දින වන විට හෝ ඊට ප්‍රථම මෙම සභාව සමඟ ගිවිසුම් අත්සන් කළ යුතු ය.

පිළිගත් ලංසු කරු ආරක්ෂණ ඇප තැන්පතුවක් වශයෙන් රුපියල් ලක්ෂ තිස්අටක මුදලක් සභාවේ තැන්පත්කළ යුතු ය. එය ඉල්ලුවිට ගෙවනු ලබන බැංකු බැඳුම්කරයක් (On Demand Bond) මඟින් ද ගෙවිය හැකි ය.

ලංසු පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අවසාන තීරණය බළන්ගොඩ නගර සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතු ය.

2017 පෙබරවාරි මස 07 වන දින,
බළන්ගෙඩ නගරසභාවේ දීය.

එස්.එච්.ඒ. කරුණාරත්න,
ලේකම් /විශේෂ කොමසාරිස්
බළන්ගොඩ නගර සභාව.